# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උද්දික ප්‍රේමරත්න මහතා විසින්
2022 අප්‍රේල් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 මාර්තු මස 30 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[115 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව

"ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ ආයතනයේ, පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක     දරන ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ" දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(i) ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය ශ්‍රී ලංකාවේ වෘත්තියක් වශයෙන් පිළිගැනුම සහ ප්‍රවර්ධනය;

(ii) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණවේදීන්ගේ වෘත්තීයමය තරාතිරම, ලැදියාවන්, අයිතීන්, බලතල, සුභසාධනය සහ වරප්‍රසාද සුරැකීම් සහ ප්‍රවර්ධනය;

(iii) ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි සේවා ඉංජිනේරු තාක්ෂණ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම;

(iv) මෙම වෘත්තියට සෘජුව හෝ වක්‍රව බලපාන කරුණු සම්බන්ධයෙන් ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන් හා තාක්ෂණවේදීන්ගේ අදහස් සාකච්ඡා මගින් තහවුරු කර ගැනීමෙහිලා රජය හා ආශ්‍රිත පාර්ශවයන් වෙත සංවාද මණ්ඩපයක් සකසා දීම;

(v) ක්ෂේත්‍රයට බලපාන පොදු කරුණු සම්බන්ධයෙන් ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ නියැලී සිටින ආයතන, සංගම්, නිෂ්පාදකයින්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් පුද්ගලයින් සමග කතිකාවතක නියැලීම;

(vi) ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන් සහ තාක්ෂණවේදීන් උදෙසා වෘත්තීයමය චර්යා සහ භාවිතාවන් පිළිබඳ පොදු ප්‍රමිතීන් හඳුන්වාදීම සහ ඒවා තම වෘත්තීයමය ක්‍රියාකාරකම් හි දී භාවිත කරවීම;

(vii) ශ්‍රී ලංකාව තුළ ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන් හා තාක්ෂණවේදීන් සේවයේ යෙදවීමේ දී අදාළ වෘත්තීයමය ගාස්තු පරිමාණයන් සහ ඒ ආශ්‍රිත කොන්දේසි නිර්ණය කිරීම;

(viii) වෙනත් රටවල ඉංජිනේරුවරුන් හා තාක්ෂණවේදීන්ගේ ආයතන/සංගම් සමග තොරතුරු සම්බන්ධීකරණයෙහි නිරත වීම;

(ix) එක්සත් රාජධානියේ වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරු ආයතනය (CIBSE) සහ එවැනි වෙනත් වෘත්තීයමය ව්‍යුහයන් සමග අනුබද්ධිතව ක්‍රියාත්මක වීම;

(x) ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන් හා තාක්ෂණවේදීන් හට තම අදහස් ඉදිරිපත් කිරීමට, දැනුම හුවමාරු කර ගැනීමට, සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට සහ අන්‍යොන්‍ය සුහදතාවය ප්‍රවර්ධනයෙහිලා කතිකාවතක් ගොඩනැගීම;

(xi) ගොඩනැගිලි සේවා විෂය ක්ෂේත්‍රය, විද්‍යාවක් මෙන්ම වෘත්තියක් වශයෙන් ප්‍රවර්ධනය සඳහා යොමු වීම;

(xii) ආයතනයේ සාමාජිකත්වය සඳහා ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ තොරතුරු හා අදහස් හුවමාරුව සඳහා පහසුකම් සැලසීම;

(xiii) ගොඩනැගිලි සේවා ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය සඳහා වෘත්තිකයන් වීමට ඉදිරිපත් වන අය බඳවාගැනීම සහ වෘත්තීය පුහුණුව පවත්වාගෙන යාම හා ඒ පිළිබඳව අධීක්ෂණය හා පාලනය කිරීම;

(xiv) ආයතනයේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා ගත හැකි අධ්‍යයන පාඨමාලා නිර්දේශ කිරීම හෝ අනුමත කිරීම;

(xv) ආයතනයේ සාමාජිකත්වය සඳහා සැපිරිය යුතු සුදුසුකම් නිර්දේශ කිරීම;

(xvi) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණවේදීන් වශයෙන් සුදුසුකම් සපුරාගැනීමට උනන්දුවන අයට මාර්ගෝපදේශන සකස් කිරීම;

(xvii) සන්තතික වෘත්තීයමය සංවර්ධන වැඩසටහන් තුළින් සාමාජිකයින්ගේ වෘත්තීයමය අභිවෘද්ධිය උදෙසා මංපෙත් සකසා දීම;

(xviii) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණික කටයුතු සහ එම සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීම;

(xix) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණික විෂය ක්ෂේත්‍රය ට අදාළ පොත්, ප්‍රමිතීන්, භාවිත සංග්‍රහ, ප්‍රකාශන, අත්පිටපත්, නාමාවලි, ඡායාරූප සහ එවැනි වෙනත් දෑ සහිත පුස්තකාල පිහිටුවීම හා පවත්වාගෙන යාම;

(xx) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණික විෂය පථයට අදාළ ආම්පන්න සහ උපකරණ සහ ද්‍රව්‍ය අඩංගු කෞතුකාගාරයක් පිහිටුවා එය සක්‍රීය ලෙස පවත්වාගෙන යාම;

(xxi) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණික විෂය ආශ්‍රිත ද්‍රව්‍ය, ක්‍රියාවලි, සංරචකයන්, උපකරණ, ආම්පන්න ආදී මෙවලම් සහිත ප්‍රදර්ශන ආදිය පැවැත්වීම සහ ඊට අනුබල දීම;

(xxii) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණික අංශයන්හි නව නිර්මාණ, ගවේෂණ සහ පර්යේෂණ සඳහා අනුබල දීම සහ පහසුකම් සැපයීම;

(xxiii) 8 වන වගන්තිය යටතේ නිර්වචනය වූ පුද්ගලයින් වෙත සාමාජිකත්වය පිරිනැමීම;

(xxiv) වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරු තත්ත්වය පිරිනැමීම සහ ලියාපදිංචි ලේඛනයක් පවත්වා ගෙන යාම;

(xxv) සාමූහික සාමාජිකයන්ගේ විෂය ක්ෂේත්‍ර පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යාම;

(xxvi) ගොඩනැගිලි සේවා සඳහා ප්‍රමිති සහ භාවිත සංග්‍රහ සැකසීම සහ ප්‍රවර්ධනය කිරීම;

(xxvii) ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ විෂය පථය යටතට ගැනෙන අංශයන්හි තාක්ෂණ නිබන්ධන, සඟරා, පුවත් පත්‍රිකා, ප්‍රමිති, භාවිත සංග්‍රහ සහ එවැනි ආශ්‍රිත ප්‍රකාශන මුද්‍රණය කර ප්‍රචාරය කිරීම; සහ

(xxviii) ඉහත කී අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේ අභිලාෂයෙන් ඊට අදාළ හා අවශ්‍ය උපකාරක හෝ සහෝපකාරී හෝ සියලු ක්‍රියාවන් ඉටු කිරීම.

**සාමාජිකත්වය**

4. ගොඩනැගිලි සේවා ඉංජිනේරු (ගො.සේ.ඉ.) සහ තාක්ෂණ විෂය ක්ෂේත්‍රයේ සැලසුම්, සවි කිරීම්, නඩත්තු, නිෂ්පාදන හෝ නිෂ්පාදන සැපයුම් යනා දී, කිනම් හෝ අංශයක ගොඩනැගිල්ලක ඉදිකිරීම හා බැඳුනු කාර්යයන්හි නියැලෙන කවර හෝ තැනැත්තකු හට ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ සාමාජිකත්වය ලබා ගත හැකි විය යුතු ය.

**පාලක සභාව**

5. ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකාරිත්වය පිළිබඳ සියලු කර්තව්‍යයන්, පාලක සභාවට පැවරෙනු ඇත. පාලක සභාවේ සංයුතිය විය යුත්තේ ගරු නිලධාරී මණ්ඩල සාමාජිකයන් පස් දෙනෙක් (සභාපති, යෝජිත සභාපති, ආසන්න අතීත සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික) සහ සාමාජිකයින්ගේ ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලබන ගරු නිලධාරී මණ්ඩලයේ නොවන තවත් හය දෙනෙක්, එනම් සහාධ්‍ය සාමාජිකයන් දෙදෙනෙක් ද සාමාජිකයන් දෙදෙනෙක් ද එක් ආශ්‍රිත සාමාජිකයෙක් ද සහ එක් බලපත්‍රලාභී සාමාජිකයෙක් ද වශයෙනි.

සභාපති තනතුර හැරුණු විට වෙනත් තනතුරක් දරන අයකුගේ අභාවයෙන් හිස්වූ එම තනතුර සඳහා වෙනත් සුදුසු සාමාජිකයකු පත් කර ගැනීමට පාලක සභාවට බලය ඇති අතර, සභාපති තනතුර සඳහා යෝජිත සභාපති පත්විය යුතු ය.

'ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය' සංස්ථාගත කිරීමට පෙර ක්‍රියාත්මක වූ 'ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන්ගේ සංගමයේ පාලක සභාව' විසින් "ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ" ප්‍රථම පාලක සභාවේ සාමාජිකයන් නම් කළ යුතු ය.

සභාපති සහ යෝජිත සභාපති ධුර දැරිය හැක්කේ සභාධ්‍යාය සාමාජිකලාභීන්ට පමණක් වුව ද, ගරු ලේකම් ධුරය "සාමාජික" හෝ "සභාධ්‍යාය සාමාජිකයන්ට" දැරිය හැක.

ආයතනයේ බලතල

**6.** (1) ආයතනයේ කටයුතු සඳහා ඕනෑම චංචල හෝ නිශ්චල දේපළක් ලබාගැනීම, පවරා ගැනීම, බදු ගැනීම හෝ බදු දීම, කුලියට දීම, උකසට තැබීම, ඇපයට තැබීම, විකිණීම සහ හුවමාරුව හෝ නොඑසේ නම් අත්හැර දැමීම, අවහිර කිරීම හෝ බැහැර කිරීම.

(2) ආයතනයේ අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමෙ හි ලා හෝ එහි බලතල භාවිතාවෙහි ලා හෝ අවශ්‍ය කෙරෙන සකලවිධ කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඍජුව හෝ වක්‍රව ආයතනය විසින් ඒ සඳහා පත් කළ නිල නියෝජිතයකු මගින් හෝ එළැඹීම සහ ඉටු කිරීම හෝ ක්‍රියාවෙහි යෙදවීම.

(3) ස්ථාවර/කාලීන තැන්පතු, ජංගම ගිණුම් සහ ඉතුරුම් ගිණුම් වශයෙන් කිනම් බැංකුවක හෝ පිළිගත් භාරකාර අරමුදලක හෝ අරමුදල්වල ආයතනයේ මුදල් ආයෝජනය කිරීම.

(4) එයාකාරයෙන් ආයතනයට උචිත යැයි හැඟෙන පරිදි ආයතනයේ කටයුතු අරභයා මුදල් ගෙවීම, ඇප මත ණයට ගැනීම, අත්තිකාරම් දීම හෝ ණයට දීම.

(5) ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, විභාග, ප්‍රදර්ශන යනාදියේ ගාස්තු, සාමාජිකත්වය ඇතුළත් කර ගැනීම සහ සාමාජික ගාස්තු, වාර මුදල් සහ දායක මුදල් යනාදිය පැනවීම සහ අයකිරීම.

(6) ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරයකු වශයෙන් සුදුසුකම්ලාභී වීම කෙරෙහි අපේක්ෂිත පුද්ගලයන් සඳහා නියමයන් හා කොන්දේසි නිර්දිෂ්ඨය, කළමනාකරණය, අධීක්ෂණය, පාලනය සහ නියාමනය.

(7) වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරයකු වශයෙන් සේවා සැපයීමට "සාමාජික" හෝ "සභාධ්‍ය සාමාජිකයකු" හට බලය පැවරීම.

(8) නිලධාරීන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නිරත කරවීම, මාරුකිරීම, පහකිරීම මෙන්ම ඔවුන්ට එරෙහිව විනය පියවර ගැනීම සහ ඔවුන්ගේ සේවා කොන්දේසි සකස් කිරීම සහ පැනවීම.

(9) ආයතනයේ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා මෙන්ම සාධනයෙහි ලා අවශ්‍ය වන්නා වූ ද, ආනුෂංගික වූ ද, හිතකර වූ ද, සකලවිධ දෑ සහ ක්‍රියා ඉටු කිරීම.

(10) ගො. සේ. ඉ. හා ආශ්‍රිත කාර්යයන් හි දී පැනනැගෙන, ආරාවුල් විසඳීම, සමථකරණය සහ විශේෂඥ සාක්ෂි සේවා සඳහා සහභාගි වීම.

(11) ආයතනයේ අරමුදල්, සම්පත් සහ දේපළ නිල කාර්යයන් සඳහා ම පමණක් භාවිතා කිරීම.

(12) ඕනෑම අයදුම්කරුවකු හෝ සාමාජිකයකු හෝ බඳවා ගැනීම, දෝෂාරෝපණය, සාමාජිකත්වය අත්හිටුවීම, විනය ක්‍රියාමාර්ග ගැනීම, පහ කිරීම, ඉල්ලා අස්වීම බාර ගැනීම මෙන්ම ආයතනයේ සාමාජිකත්වය හා ආශ්‍රිත සකලවිධ දෑ සහ කටයුතු ක්‍රියාත්මක කිරීම.

**7.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, එකී රැස්වීම්වල ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සාමාජිකයකු වීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීමට සපුරාලිය යුතු සුදුසුකම්;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය තෝරා පත් කර ගැනීම; සහ

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනි ම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දයක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් මෙතෙක් බාර ගන්නා ලද හෝ මින්මතු බාර ගනු ලබන ත්‍යාග, රික්ථවරණ, පරිත්‍යාග, දයක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක් බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව

**10.** නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් පදනම සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව පදනමට නීතියෙහිලා හැකියාව සහ බලය ඇති අතර, එවැනි සියලු දේපළ විකිණීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද පදනමේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා ඒ සියලු දේපළ පදනම විසින් දැරිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ*

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙද දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

*ගිණුම් සහ විගණනය*

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වැය කරන ලද සංස්ථාවේ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සෑම වර්ෂයකදීම යටත් පිරිසෙයින් එක් වරක් ගිණුම් පරීක්ෂා කොට විගණනය කර ගත යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව*

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමක ට පාරිබාහිරව විය යුතු ය.

*ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම*

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**15.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.